# දැන්වීමයි

## ප්‍රසංගකලා / ජනමාධ්‍ය අධ්‍යයනාංශයන්හි සිව්වන වසර සිසුන්ගේ දැනගැනීම සඳහා

## අවසන් වසර උපාධි නිබන්ධන බාර දීම.

2019/2020 අධ්‍යයන වර්ෂයේ ජනමාධ්‍ය සහ ප්‍රසංග කලා අධ්‍යයනාංශයන්හි අවසාන වසර සිසුන්ගේ උපාධි නිබන්ධන බාර දිය යුතු අවසාන දිනය 2021 අගෝස්තු 25 බව කරුණාවෙන් සළකන්න.

ඒ අනුව සිය නිබන්ධන පැමිණ බාර දීමට අපහසු සිසුන් වෙනුවෙන් 2021 අගෝස්තු 25 දින රාත්‍රී 12.00 ට පෙර ශ්‍රී පාලි මණ්ඩප ඉගෙනුම් කළමනාකරණ පද්ධතියෙහි (LMS) ඔබට අදාළ පාඨමාලාවේ Dissertation කොටසට උපදේශකවරයාගේ අත්සන සහිත සම්පූර්ණ කරන ලද නිබන්ධනයේ මෘදු පිටපත (Soft Copy – PDF Version) උඩුගත කිරීමට අවස්ථාව සළසා දී ඇත.මෙම පියවර ගෙන ඇත්තේ පවතින තත්වය හමුවේ උපාධි නිබන්ධන නියමිත දිනට බාර දීමේ අවස්ථාව ඔබ වෙත සළසා දීම වෙනුවෙනි.

ඔබගේ උපාධි නිබන්ධනය අංග සම්පූර්ණ ලෙස නිසිපරිදි උඩුගත කර තිබීම අනිවාර්ය වන අතර එසේ උඩුගත කළ නිබන්ධන පමණක් අදාළ දිනට බාර දුන් බවට සළකනු ලැබේ.

මෘදු පිටපත බාරදීම හා සමගාමීව ඔබගේ නිබන්ධනද නිසිපරිදි විභාග අංශය වෙත බාර දීම අනිවාර්ය වේ.

තවද දිවයිනේ පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් උපදේශකවරයාගේ අත්සන සහිත සම්පූර්ණ කරන ලද ඔබගේ නිබන්ධන පිටපත් දෙක ලියාපදිංචි පාර්සල් තැපැලෙන් හෝ කූරියර් සේවාවක් මගින් එවිය හැකි අතර, එම නිබන්ධන 2021.09.30 දින පස්වරු 03.30 ට පෙර විභාග අංශය වෙත ලැබෙන සේ එවිය යුතු වේ.තවද එහිදී සිදු විය හැකි ප්‍රමාදයන් හෝ අස්ථානගතවීම් පිළිබඳව අදාළ සිසුන් විසින් වගකීම බාරගත යුතු වේ.
එසේම එම නිබන්ධන පැමිණ බාර දීමටද අවශ්‍ය පහසුකම් සළසා දී ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරී / විභාග
ශ්‍රී පාලි මණ්ඩපය
2021.08.12